# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
2024 ඔක්තෝබර් / නොවැම්බර්

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ සංස්කෘතිය (නව නිර්දේශය)

**ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය හා සාහිත්‍ය විචාරය BUCU – 18224**

කොටස් දෙකෙන්ම ඇතුළත් වන සේ
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. ගෘහ ජීවිතයේ සාර්ථකත්වය පිණිස ඉවහල්කර ගතහැකි සදුපදේශ ඇතුළත් මූලාශ්‍රයක් ලෙස දීඝනිකායේ සිගාලෝවාද සූත්‍රයේ සාර්වත්‍රික හා සර්වකාලීන වටිනාකම අගය කරන්න.

02. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ නායකත්ව ලක්ෂණ හඳුනාගැනීමෙහි ලා මහාපරිනිබ්බාන සූත්‍රයේ කවර කරුණු ඉවහල් කරගත හැකිදැයි පැහැදිලි කරන්න.

03. බුදුසමය නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදාව පදනම් කරගත්තද එය සෞන්දර්ය හා රසාස්වාද විෂයෙහි බාධාවක් ලෙස නොසලකන අයුරු සක්කපඤ්හ සූත්‍රය ඇසුරින් තහවුරු කරන්න.

04. බෞද්ධ භික්ෂු සමාජයේ සංවිධානමය ව්‍යූහය සකස්වීමේ ඓතිහාසික විකාශය අධ්‍යයනය කිරීමේ මූලාශ්‍රයක් ලෙස මහාවග්ගපාළියේ මහාඛන්ධකයේ උපයෝගීතාව පහදන්න.

05. භික්ෂු චර්යාව විධිමත් කිරීමෙහිලා සේඛියා ධර්මවල ඇති වැදගත්කම ගෙනහැර දක්වන්න.

## II කොටස

06. ජාතක කතාවන්හි ඇතුළත් චරිත මගින් මතුවන මනෝවිද්‍යාත්මක ලක්ෂණ, තෝරාගත් ජාතක කතා තුනක් ඇසුරින් ගෙනහැර දක්වන්න.

07. ශ්‍රී ලාංකේය සංස්කෘතියේ බහුවිධ ක්ෂේත්‍ර කෙරෙහි වෙස්සන්තර ජාතකය උපස්තම්භක වී ඇති අයුරු විභාග කරන්න.

08. ගැඹුරු පෙළදහම පොදු ජනයාට මැනවින් වටහාගැනීම පිණිස ලෝවැඩ සඟරාවේ අන්තර්ගතය කෙතෙක් දුරට උපකාර වන්නේ දැයි පැහැදිලි කරන්න.

09. මහාකාව්‍ය ලක්ෂණ දක්වා, කව්සිළුමිණ මහාකාව්‍යයක් වශයෙන් අගය කළ හැකි අයුරු පරීක්ෂා කරන්න.

10. දේශීය නාට්‍ය නිෂ්පාදනයෙහි ලා අපූර්වත්වයෙන් වස්තුවිෂයක් ලෙස ජාතක කතා භාවිතයට ගෙන ඇති අයුරු එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නිර්මාණ සංචිතය ඇසුරින් පරීක්ෂා කරන්න.

**************************